මුරගල හා එහි සංකේතයන්ගෙන් නිරූපිත දාර්ශනික අර්ථ

බී. එච්. නිසංසලා නයනකාන්ති

සහාය කථිකාචාර්ය පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
පේරාදෙණි විශ්වවිද්‍යාලය පේරාදෙණිය, ශ්‍රී ලංකාව
nisansala861@gmail.com

හැඳින්වීම

බුදුදහම වනාහි විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ සමාජයට ඉතාමත් සමීප වූ දර්ශනයකි. සමාජයෙහි පවත්නා සෙසු ආගම්වලට හිමි නොවන කලාත්මක අංශයක් බුදුදහම සතුව පවතී. කලාව, බුදුදහම සමාජයට සම්ප්‍රේෂණය කරන මාධ්‍යයක් ලෙස අතීතයේ පටන් මේ දක්වා භාවිත වේ. මේ උදෙසා නොයෙකුත් කලාකෘති නිර්මාණය වූ අතර මුරගල ඒ අතුරින් සුවිශේෂී වූ කලා නිර්මාණයකි.

මුරගලෙහි සංකේතාත්මක අර්ථය විමසීමට පූර්වයෙන් **සංකේත** යනු කුමක්දැයි විමසිය යුතුය. ප්‍රාථමික අවධියේ පවා මානවයා ස්වකීය මනෝභාවයන් සන්නිවේදනය කිරීමට විවිධ සංකේත භාවිත කළ බව පෙනේ. එහිදී සජීවී අජීවී වස්තු පමණක් නොව මනඃකල්පිත සලකුණු ද වස්තුවිෂය කරගෙන ඇත.

සංකේත මගින් සිතිවිලි ද සිතිවිලිවලින් සංකේත ද නිරූපණය වන බව පෙරියෂී නම් විද්වතාගේ මතයයි. තවත් අර්ථකථනයකට අනුව සංකේත නම් නිදහස් පදනමක් ඇතිව යමක් නිරූපණය කිරීමට යොදනු ලබන සලකුණකි. එමෙන්ම විවිධ දාර්ශනික අදහස් තුළින් සංකේත දෙස බැලූ අය සංකේත නම්, නිදහස් බුද්ධිමය හා විඥානමය චර්යාවේ ස්වරූපය දක්වන්නක් බවට කරුණු ඉදිරිපත් කළහ. බොහෝ අර්ථකථන දෙස බලන විට කලාව වනාහි සංකේතාත්මක භාෂාවක් බව ප්‍රත්‍යක්ෂ වේ.

ඉපැරණි කලාකරුවාගේ නිසග කලා හැකියාවත්, කලා නෛපුණ්‍යයත් ලොවට විදහාපාන කදිම නිර්මාණ එකතුවකි පුරාණ ලංකාවේ ගෘහනිර්මාණ ශිල්පය. සැම පූජනීය ස්ථානයකම හෝ රාජකීය වාසස්ථානයකම ප්‍රවේශ දොරටුවෙහි විවිධ වූ කලාත්මක අංගවලින් අලංකාර කොට තිබීම සාමාන්‍ය වූවකි. **පැරණි විහාරවලට පිවිසෙන පියගැට පෙළ දෙපස කොරවක් ගල ආවරණය වන පරිදි හරස් අතට පිහිටුවා ඇති ගල් පුවරුව මුරගල නම් වේ.** ලක්දිව ආරාම ආශ්‍රිතව පමණක් බිහිවූ මෙම කලා නිර්මාණය අනුරපුර යුගයෙහිදීම ඇති වී එම යුගයේදීම කලාත්මක අංශයෙන් පරිපූර්ණත්වයට පත්වූවකි.

මුල් යුගයේදී දැවයෙන් නිර්මාණය වූ මුරගල පශ්චාත්කාලීනව ශෛලීමය නිර්මාණයක් ලෙස ගොඩ නැගෙන්නට ඇත. මෙයට **සීමා ස්ථම්භයක්, ඉන්ද්‍රඛීලය, ප්‍රධාන කණුව, ආරක්ෂක ගලක්, දොරටුපාල ගල, දොරටුපාල රූපය, කීර්ති මුඛ, යටිකුරු පළිහ** ආදි නම් ද භාවිත වේ.

දොරටුපාල රූපයක් පිළිබඳව තොරතුරක් සම්මෝහවිනෝදනී නම් විභඞ්ගඅටුවා කතාවෙහි පමණක් සඳහන් වේ. එනම් දොරටුපල් රූපය කෙරෙහි සිත් ඇතිව කාලක්‍රියා කළ තරුණ භික්ෂුණියක පිළිබඳ පුවතකි.

මුරගලෙහි විකාශය

පියවර කිහිපයක් ඔස්සේ මුරගලෙහි වර්ධනය සිදු වූ බව දැක්විය හැක. මුරගල් හෙවත් දොරටුපාල රූපවල නිරූපණය වී ඇති කැටයම් පුවරු අනුව ඒවා කොටස් කිහිපයකට බෙදා වෙන් කළ හැක. එනම්

1. දෙකොන් හැඩ ගස්වන ලැබූ කැටයම් රහිත හතරැස් ගල් පුවරුව සහිත මුරගල

2. මුදුනේ මැද උන්නත සහිත ගල් පුවරුව පුන්කළස සහිත මුරගල

3. බහිරව හෙවත් වාමන රූප හා සංඛ, පද්ම රූප එක් වූ මුරගල

4. නාග, මිනිස් වෙස්ගත් නාගරාජ රූප හා නාගිනී, රූප සහිත මුරගල

5. දිසා පාලක රූප සහිත මුරගල

දෙවන අවස්ථාව

මුරගලක සමතලා කළ ඉදිරි පැත්තේ පුන්කළසක සටහනක් නොගැඹුරු රේඛාවන්ගෙන් කැපීම එහි පළමුවන රූකම් කිරීමයි. පුන්කළස හෙවත් පූර්ණඝටය අද වන තුරුම විශේෂ ඵලදායී සුභ ලකුණක් ලෙස සැලකේ. කළස හිස්ව තැබීමට වඩා කළස මත මල් හා අතු කැටයම් කර පිරීගිය කළසක් නිර්මාණය කිරීමට කලාකරුවා හිතන්නට ඇත. ශ්‍රී ලංකා සංස්කෘතිය තුළ වන අෂ්ටමංගල සංකේතවලින් එකක් ලෙස පුන්කළස පිළිගැනේ. සශ්‍රීකත්වයේ සංකේතයක් ලෙස ඉන්දියා හා ලංකා සමාජයේ භාවිතා වූ පුන්කළස බෞද්ධ පූජනීය ස්ථාන අභිමුඛව **බලාපොරොත්තුව, ප්‍රසන්නතාව හා අභ්‍යන්තරික සැනසීම** වැනි හැඟීම් මෙන්ම **අධ්‍යාත්මික වූත් බාහිර වූත් උපද්‍රව නිරාවරණය කරන ආරක්ෂක හැඟීමක්** ද ඉන් නිරූපිත යැයි උගත්හු සළකති. **සෞභාග්‍යය, සශ්‍රීකත්වය, සමෘද්ධිය, ලාභාපේක්ෂාව හා ධන ලාභ වැනි කරුණු** මෙලෙස පුන්කළස් නිර්මාණයෙන් බලාපොරොත්තු වූ බවට ද සිතිය හැක.

කල්ප වෘක්ෂ සහිත පුන්කළස් ද හමු වේ. කල්ප වෘෂක්ෂය වනාහී සිතූ පැතූ සම්පත් ලබා දෙන දිව්‍යමය වූ වෘක්ෂයක් ලෙස විශ්වාස කෙරෙයි. මනසාරයෙහි, සිබ වළඳ හා සිබ වළඳ විනිස, ජෛන ආගමික ග්‍රන්ථ, පූජාවලිය ආදි ග්‍රන්ථවලදී ද පුන්කළස අෂ්ට මංගල වස්තූන්වලින් එකක් ලෙස සාකච්ඡා කෙරේ. අනුරාධපුර අභයගිරි චෛත්‍යයේත් පොළොන්නරුවේ විජයබාහු මාළිගයේත් මුරගල්වල දක්නට ලැබෙන දොරටුපාල රූපවල පද්මාකාර හිස් වැසුම් හා ඒ මත ශංඛ රූප දක්නට ලැබේ. මෙහි දැක්වෙන කළස යෝනියේ සංකේතයක් බව **මැකැන්සි පිඩ්තුමා** දක්වා ඇත. පද්මය විශ්වයේ යෝනිය සංකේතවත් කරන බවට **ඊ. බී හැවල් මහතා** පවසයි.

තෙවන අවස්ථාව

මුරගල විකාශනය වීමෙහි මීළඟ අවස්ථාව 'වාමන බහිරව' හෙවත් 'භූත රූප' නෙලීමයි. මිටි, මහත කෙටි අත් පා ඇති මෙම රූපවල දකුණු අතින් ගත් යෂ්ටියක් වැන්නක් ඇත. මෙම රූප යක්ෂ සේවකයන් දෙදෙනකු වූ සංඛ හා පද්මගේ යැයි සැලකේ. විද්වතුන්ගේ මතය නම් බහිරව රූපයේ ඉදිරියට නෙරා ඇති විශාල උදර කොටස පුන්කළසෙහි සංකේතයක් වන බවයි. එමෙන්ම ජලයෙහි වසර ගණනාවක් විවිධ විපර්යාසයන්ට ලක්ව නිමවෙන ශංඛය හා ජල මතු පිටට විත් පිපී නටන පද්මය ද ජලය පිළිබඳව ශුද්ධ වූ අර්ථයම ප්‍රකාශකරන බව සිතිය හැක. රාජතරංගනියෙහි සඳහන්වන පරිදි මොවුන් දෙදෙනාගෙන් එක් අයෙකු ජලයට අධිපතියෙකි. මඩෙහි හටගෙන දියේ නො ඇලී පිපී සුවඳ බෙදන පද්මය උත්පත්තියේ හා නිවනේ සංකේතයන් ලෙස දැක් වූ අවස්ථා අපට හඳුනාගැනීමට හැක.

ශංඛ හා පද්ම යනු කුවේරගේ ධන නිධාන නමයෙන් දෙකකි. එය සාගරයෙන් මතු වූ අතර ජලය හා සම්බන්ධ වේ. කෘෂි කාර්මික සංස්කෘතියක් පදනම්ව ගොඩනැගී ඇති ශ්‍රී ලංකා ආර්ථිකය ජලය මූලික කරගෙන නිර්මාණය වී ඇත. ඒ බව සංකේතවත් කිරීම උදෙසා මෙලෙස මෙම සංකේත උපයුක්ත කර ගත් බව සිතිය හැක.

සිව්වන අවස්ථාව

නාග, මිනිස් වෙස්ගත් නාගරාජ රූප හා නාගිනී රූප සහිත මුරගල තවත් මුරගලෙහි එක් අවස්ථාවකි. **ධනය සමග ද ආත්මය සංකේතවත් කිරීමට පුනරුත්පත්තිය සංකේතනයට පුද්ගලයන්ට ගරු කිරීමට, හා ලිංග වන්දනය** උදෙසා ද නාග සංකේතය භාවිතා කර ඇත. බෞද්ධ සාහිත්‍ය තුළට නාග සංකේතය බුදුන් ජීවමාන අවධියේම එකතු විය. බුදුන් නාග කුලවල උපන් බව ජාතක කථා දෙස් දෙයි. ශීලව නාගරාජ ජාතකය තුළ නාගයන් සතු විවිධ බල පරාක්‍රමයන් මෙහි දක්වා ඇත. නාගයා ගින්න සංකේතවත් කිරීමට උපයුක්තය. මහාවග්ග පාළිය, කුලාවක

ජාතකය, අලගද්දූපම සූත්‍රය ආදී තැන්වල නාග සංකේතය ගැන කතා කරයි. පාලි සාහිත්‍යයේ නාග උපමාවෙන් **කාමයත් ආරක්ෂාවත** අතර සම්බන්ධයක් දක්වයි. **ක්ෂීණාශ්‍රව භික්ෂූන්ව හැඳින්වීමට ද නාගයා යන්න භාවිතා කොට ඇත.**

නමුත් නාග රූපය යෙදෙන ස්ථානයන් අනුව එහි වන සංකේතාර්ථය වෙනස් වීමක් ද සිදු වනු ඇත. මේ අනුව බලන කළ මුරගලෙහි වන පෙන ගොබ 3කින් යුතු නාග කැටයම් තණ්හාවේ ප්‍රභේදයන් වන, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන තණ්හාවන් සංකේතවත් කරන බව සිතිය හැක. මෙය ඇතැම් විට ත්‍රිවිධරත්නය යනාරුතින් ද පෙන්වයි.

පස්වන අවස්ථාව

අවසාන වශයෙන් මුරගලට මකර තොරණ ද එක් විය. මකර සංකේතය අතීතයේ පටන්ම ජලය සංකේතවත් කිරීමට යොදාගත් සංකේතයකි. මරණයේ සංකේතයක් ලෙස ද මකරා සැලකේ ජලය, කාලය, සශ්‍රීකත්වය, ප්‍රජනනය, මරණය වැනි දේවල් නිරූපණය කිරීමට මකර සංකේතය උපයුක්තව ඇත. එමෙන්ම විනාශය හා අනිත්‍ය නිරූපණයට මෙම මකර සංකේතය භාවිත බව පෙනෙයි.

මෙහිදී භාවිත ක්‍රමවේදය වන්නේ සාහිත්‍යයික තොරතුරු ගවේශනය කරමින් ඒවා කලා කෘති හා සසඳා බැලීමයි.

මුල්කාලීනව උපයෝගිතාත්මක අර්ථයෙන් නිර්මාණය වූ මුරගල පසු කාලීනව විවිධ දාර්ශනික සංකේතාර්ථයන් නිරූපණය උදෙසා නිර්මාණය විය. ඇතැම් විට එය හුදෙක් කලාත්මක නිර්මාණයක් පමණක් වන්නට ද ඇත. කෙසේ වෙතත් කාලයෙන් කාලයට මුරගලෙන් නිරූපණය වූ අර්ථයන් විවිධ බව මින් පෙන්වා දිය හැක.

ආශ්‍රෙය ග්‍රන්ථ

අංගුත්තර නිකාය, බුද්ධ ජයන්ති මුද්‍රණ, පංචම භාගය, ශ්‍රී ලංකා ජනරජ ප්‍රකාශන, 1977.

පන්සිය පනස් ජාතක පොත් වහන්සේ, අමරමෝලි හිමි, වේරගොඩ, ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම, කොළඹ, 2005.

අමරතුංග විජයසිරි, ශ්‍රී ලංකාවේ මූර්ති හා කලා, ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත, වරකාපොල, 1993.

ගොඩකුඹුර චාල්ස්, මුරගල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.